---

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 21 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 නොවැම්බර් 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ දෙකකට පෙර සිට පැවත එන රු.22,785 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගෙන තිබුණු රු.137,642 ක් වූ ස්ථාවර වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වියදම් ලෙස නොදක්වා පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි. එමෙන්ම රු.46,267 ක් වූ වානේ අල්මාරි 03 හි අගය හැර රු.91,375 ක් වූ ස්ථාවර වත්කම්වල අගය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.184,540 ක් වූ මූලධන ආධාර වෙනුවෙන් නැවත ප්‍රතිපාදන සලසා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් හා මූලධන ආධාර රු.184,540 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### (අ) පිළිතුරු නොළත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 03 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.250,385 ක් විය.

#### (ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.91,304,446 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,280,440 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,378,161 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **ආදායම් විෂයය** | | **ඇස්තමේන්තුගත** | **තථ්‍ය** | **දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | අක්කර බදු | 114 | 2,177 | 223 |
| (ii) | බදුකුලී | 2,266 | - | |
| (iii) | බලපත්‍ර ගාස්තු | 486 | 575 | 28,909 |
| (iv) | වෙනත් ආදායම් | 3,475 | 4,807 | |

## 2.2.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතු රු.223,118 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,210,725 |
| (ii) | මුද්දර ගාස්තු | 6,387,015 |

## 2.2.4 කඩ කාමර බදුදීම

මාපලගම වෙළඳ සංකීර්ණ දෙමහල් ගොඩනැගිල්ල කඩකාමර හා තල්ගස්වල පොදු වෙළඳ පොල කඩ කාමර බදුදීම පිළිබඳව 2013 පෙබරවාරි 20 දින කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

(අ) සෑම බදු ගිවිසුමක් ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත්, කඩ කාමරවලට අදාලව බදු ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර අතුරු බදු දී තිබූ අතර ඇතැම් කඩ කාමර වසාදමා තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දක්වා මාපලගම කඩකාමර වලින් රු.138,600 ක් හා තල්ගස්වල කඩ කාමර වලින් රු.39,900 ක හිඟ කුලී අයවිය යුතුව තිබුණි.

**2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු රු.3,900,000 ක් වටිනා J.C.B. 3CX යන්ත්‍රය 2011 මාර්තු 18 දින සිට විගණන දිනය වූ 2012 දෙසැම්බර් 07 දින දක්වා මාස 21 ක කාලයක් නිශ්ක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට හෝ අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින්නේ නම් එය අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) මහජන බැංකුවෙහි පවත්වා ගෙනයනු ලබන ජංගම ගිණුමක් 2010 වර්ෂයේ සිට අක්‍රියව පැවත ඇති අතර, 2012 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.15,000 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී ද එම ගිණුම වසා දැමීමට අවශ්‍ය කටයුතු සභාව විසින් කර නොතිබුණි.

**2.4 අවිධිමත් ගනුදෙනු**

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට දීමනා ගෙවීම් සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2006 ඔක්තෝබර් 05 දින අංක:1413/15 දරන ශ්‍රී ලංකා ජනරජයේ (අතිවිශේෂ) ගැසට් නිවේදනයේ විධිවිධාන වලට පටහැනිව 2011 වර්ෂය තුළ මාසික සභා රැස්වීම් සඳහා නොපැමිණි වෛද්‍ය සහතික ඉදිරිපත් නොකල මන්ත්‍රීවරුන් 07 දෙනෙකුට මාසික සභා රැස්වීම් සඳහා දීමනා වශයෙන් රු.41,500 ක් ගෙවීම් කර තිබුණි.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) **ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති**

සභා බලප්‍රදේශය තුළ ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ රු.347,741 ක් අදාල ව්‍යාපෘති සඳහා භාවිතා නොකර, විගණන දින වූ 2013 පෙබරවාරි 20 දින තෙක් කර්මාන්ත ගිණුමෙහි නිශ්ක්‍රීයව රඳවා තිබුණි.

(ආ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**2.6 කොන්ත්‍රාත් පාලනය**

**උඩුගම හොර වංගුව ජර්මන් කන්ද පාර සහ උඩුගම ඉහළ පාර සංවර්ධනය කිරීම**

උඩුගම හොර වංගුව ජර්මන් කන්ද පාර සහ උඩුගම ඉහළ පාර සංවර්ධනය කිරීම සඳහා CT 18 ඩෝසර් යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් 2012 ජුනි 28 දින රු.155,885 ක් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ද ඉන්ධන මිළදී ගැනීම වෙනුවෙන් එදිනම රු.85,708 ක මුදලක් සභාපති වෙත ද ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) උඩුගම ඉහල පාර සංවර්ධනය කිරීම වෙනුවෙන් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණ ද, ඩෝසරය යෙදවීම වෙනුවෙන් පැය 23 ක් සඳහා රු.50,600 ක් ද, ඉන්ධන ලීටර් 276 ක් සඳහා රු.31,795 ක් වශයෙන් රු.82,395 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) ඩෝසර් යන්ත්‍රය සඳහා ඉන්ධන මිළදී ගැනීමේ දී ඉන්ධන ඇණවුම් භාවිතා නොකර, සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ ඉන්ධන බිල්පත් සඳහා සභාපති වෙත රු.85,708 ක් ගෙවා තිබුණි.

(ඇ) ඩෝසර් යන්ත්‍රය පැය 62 ක් අදාල කර්මාන්ත දෙක සඳහා යෙද වූ බවට සහ ඒ සඳහා ඉන්ධන ලීටර් 744 ක් ඩෝසරයට යෙදූ බවට සභාවේ තාක්ෂණික නිලධාරියෙකු විසින් තහවුරු කර නොතිබුණි.

## 2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය